"හොඳයි ඩොක්ටර්.." ස්නේහා කීවාය. සාත්තුවක් අවශ්‍ය නැත්නම් මේ ඉස්පිරිතාලෙට ඇතුල්වෙලා ඉන්නෙ ඇයිද කියා අහන්නට හිතුනත් වැඩි පණ්ඩිතකම් අවශ්‍ය නැතැයි ඇයම තීරණය කළාය.

"පුතේ කරබාගෙන තමන්ගෙ වැඩේ විතරක් කරගෙන ඉන්න... කොතැනකදිවත් වැඩි පණ්ඩිත කම් වලට යන්න එපා.." අප්පච්චි කියාදුන්නේ එහෙමය. පුංචි වුණත් ඒ පාඩම බොහෝ වටින බව මේ පොඩි කාලයට ස්නේහා තේරුම්ගෙන සිටියාය.

"කවුරු ඇහුවත් අකලංක ගැන කිසිම දෙයක් කා එක්කවත් කතා කරන්න එපා ස්නේහා.." මේනක ස්නේහා දෙසට හැරී කිව්වේ රහසින් වගේය.

"හොඳයි ඩොක්ටර්.." ස්නේහා හිස සළා එකඟතාව පෙන්නුවාය.

"සල්ලි වැඩි වුණාම සමහරුන්ට පිස-සු හැදෙනවා ස්නේහා.. ඒ ලෙඩ වලට බේත් නැහැ.. ඒ ලෙඩ හොඳ වෙන්නෙත් නැහැ.." මේනක කීවේ විදුලි සෝපානය අසළදී ය.

"සර්ටත් ගොඩක් සල්ලි තියෙනවනෙ" ඒ කතාව නොකීවා නම් හොඳ යයි ස්නේහාට හිතුණේ දෙවනුවටය

මේනක නැවතී ස්නේහා දෙස බැලුවේ නළල රැළිකරගෙන ය.

"මටත් පිස්සුද කියල නේද ඔය ඇහුවෙ.." ඔහු ඇසුවේ ය.

ස්නේහා කිසිවක් නොකියා ඔහු දෙස බැලුවේ සමාව අයදින බැල්මකින් ය.

".. මටත් පිස්සු හැදෙන්න තිබ්බ මාත් අකලංක වගේ උපන් සල්ලිකාරයෙක් නං.. ඒත් ස්නේහා මං බෙහොම පොඩි තැනකින් ආව පොඩි මනුස-සයෙක්ය කියන එක මගේ හිතේ හැම තිස්සෙම තියෙනවා" ඔහු කීවේ සෝපානයට ගොඩවන අතරය.

ස්නේහා ඔහු පසු පසින් සෙ-ෝපායට ඇතුල් වූ පසුව දොර වැසුණි. මේනක සමගින් සෙ-ෝපානය තුළ තනිවීම ස්නේහාගේ සිතේ ඇතිකළේ පොඩි තිගැස්මකි. බය වන්නට දෙයක් නැත. දොස්තර මේනක සිරිවර්ධන හොඳ හැදිච්ච ගති ඇති තරුණයෙක් බව ඈ දැන සිටියාය. ලිෆ්ට් එක පුරාම පැතිරුණේ මේනක ගල්වා සිටි මිල අධික විලවුන් සුවඳය. ඒ අපූරු සුවඳ මැද්දේම මේනකගෙ ඇස් නැවතී තිබුණේ ස්නේහාගේ මුහුණ මතමය. හීන් හිනාවක්ද ඔහුගේ මුවේ ඇඳී තිබුණි.

"අකලංක සර්ට සනීප නැත්නම් ඉස්පිරිතාලෙට වෙලා ඉන්නෙ ඇයි?" ඒ ප්‍රශ්නය ස්නේහා ඇසුවේ නැත . හිතින් හිතුවා පමණය. මේකනගෙන් ප්‍රශ්න අසන්නට තරම් ශක්තියක් දැන් ඇගේ හිතේ නැත. පණ්ඩිත ප්‍රශ්න අහන්නට ගොස් දොස්තර මහත්තයාගෙන් බැණුමක් අහගන්නට ඇය කැමතිද නැත.

විදුලි සෝපානය ඉක්මණින්ම පහළ තට්ටුවට ආවේ ය. ඒ ගමනට තවත් ටිකක් වේලා ගියා නම් හොඳ යයි ස්නොහාට හිතුණි. දොස්තර මහත්තයා ගල්වාගෙන සිටි විළවුන් වල සුවඳ ඒ තරම්ම අපූරු ය.

"මේ මනුස්සයගේ වැඩේ නිසා මං තාම උදේට කෑවෙත් නැහැ.." විදුලි සෝපානයෙන් බහින අතරේදී මේනක කීවේය. "..ස්නේහා එනවද මාත් එක්ක මොනව හරි කන්න යන්න?"

ඒක නම් හොඳ යෝජනාවක් යයි ස්නේහාට නොසිතෙයි. අද දොස්තර මහත්තයාගේ කතා බව වෙනදාට වඩා වෙනස් ය. ඔහු මේ තරම් කුළුපග ලෙස කතා කළ දවසක් ස්නේහාට මතක නැත. එහෙම දවසක් තිබුණේම නැත.

"මං වැඩනෙ සර්.." ස්නේහා කියන්නේ ගොඩින්ම බේරෙන්න හිතාගෙනය.

"ඒ බූරුවා මාව අවුස්සාගත්තෙ නැත්නං මේ මොකුත් නැහැනෙ...."



ඒක නම් හොඳ යෝජනාවක් යයි ස්නේහාට නොසිතෙයි. අද දොස්තර මහත්තයාගේ කතා බහ වෙනදාට වඩා වෙනස් ය. ඔහු මේ තරම් කුළුපග ලෙස කතා කළ දවසක් ස්නේහාට මතක නැත. එහෙම දවසක් තිබුණේම නැත.

"ඒකට කමක් නැහැ.. ඒක මං බලාගන්නං.." දොස්තර මහත්තයාට ගාණක්වත් නැත. ඔවුන් පසුකර යමින් සිටි හෙදියන් දෙදෙනකු හැරී හැරී බලනු ස්නේහා දුටුවාය. මුන් දැන් තව පදයක් හදයි.. හවස් වෙනකොට මුලු ඉස්පිරිතාලෙම ගිනි තියයි ඇයට සිතුණි.

"අනේ ඩොක්ටර් මං කාලනෙ ඉන්නෙ.. දැන් ආයෙම කන්නත් බැහැනෙ.. අනික.. අනික.." ස්නේහා ගොත ගැසුවාය. මේනක සිනාසුණේය. කෙල්ල පස්ස ගසන හේතුව ඔහුට සිතා ගත හැකිය. ඒ ගැන පුදුමවන්නට දෙක් නැත. හැමදාම තමා වාට්ටු පුරා ඇවිදිද්දී බලා සිටිනා ඇගේ අහිංසක බැල්මෙන් ඔහු ඇය හඳුනාගෙන සිටියේ ය.

"කමක් නැහැ.. හැමදාම මං එන්නෙ මහ කලබලයකින්නෙ.. ඔයා එක්ක නිස්කලංකව කතා කරන්නත් හිතේ ඕනෙකම තිබුණා.. අද මට පොඩි විවේකයක් තියෙන නිසයි පොඩ්ඩක් කතා කරන්න හිතුවෙ.." ඔහු කියන්නේ කිසිම ගාණකට නැතුව සැහැල්ලුවෙනි.

ස්නේහාට පුදුම සිතුණි. දොස්තර මහත්තයා මේ තරම් සරළව කතා කරනු ඇය කවදාවත් අසා නැත. හැමදාම ඇයට ඔහු පෙනුණේ කතා කරන්නට තබා ළඟින් ඉන්නටවත් ඉඩක් නැති දැවැන්තයකු හැටියටය. ඒ දැවැන්තයා මෙහෙම කතා කරනකොට පුදුම නොහිතා කොහොමද?

"යන්න.. පරිස්සමින් වැඩ කරන්න.. මං වෙන දවසක ඔයා එක්ක කතා කරන්නම්.." ඔහු කීවේය. ".. මං කිව්ව දේවල් මතක තියාගන්න.. සල්ලිකාරයෙ ඕනාවට වැඩිය විශ්වාස කරන්න එපා.." ඔහු කීවේ ය. ".. මං කිව්වෙ උපන් සල්ලිකාරයො" ඔහු දෙවෙනුවට එකතු කළේ ය.

ස්නේහා අඩියට දෙකට කොමන් රූම් එක පැත්තට පැන ගත්තාය. ආපහු හැරී මේනක යන දිහා බලන්නට හිතුණත් ඒ හිත හංගා ගන්නට ඇයට හැකි විය.

"හැරිලා බලනවා දැක්කොත් මං ගැන මොනා හිතාවිද?" ඈ හිතුවේ එහෙමය. ඒ නිසාම ඊතලයක් වගේ කෙළින්ම ගිහින් නැවතුණේ මේට්‍රන් සුනන්දා ළඟය.

"කවුද අප්පා අර ලෙඩක් නැතිව ඇඩ්මිට් වෙලා ඉන්න හාදයා?" ස්නේහා ඇහුව විලාසයට මේට්‍රන් සුනන්දා ගේ මුවටත් සිනාවක් නැගුණි. ඒත් ඒ එක්කම ඒ හිනාව හංගාගන්නට මේට්‍රන් වග බලාගත්තාය.

"ඒ අනං මනං අපට වැඩක් නෑ දුවේ.. අපේ ඩියුටිය විතරක් හරියට කරගෙන හිටියාම ඇති" මේට්‍රන් සුනන්දා එහෙම කියන්නේ හැම දෙයක්ම දන්නා නිසා බව ස්නේහාට වැටහෙයි. ඇයි ඉතින් හංගන්නෙ? හිතේ කොණක ඒ ප්‍රශ්නය හැංගි මුත්තම් කළේය.

"එයා ඩොක්ටර් මේනකගෙ යාලුවෙක් මැඩම්" ස්නේහා කියන්නේ නිකමට ය.

"කාගෙ කවුරු වුණත් අපට කාරියක් නැහැ දුවේ.. තමන්ගෙ ඩියුටිය විතරක් කරගෙන ඉන්න.. ඔය කිසි දෙයක් හාරා අවුස්සන්න හදන්න එපා" මේට්‍රන් සුනන්දා කියන්නේ රහසින් වාගේ ය.

ස්නේහා හිස වනා එකඟතාව පළකළා ය.

මේට්‍රන් සුනන්දාගේ මේසය මත ඇති පත්තරය ස්නේහාට පෙනෙයි. එහි උඩින්ම ඇති සේයාරුවට ඇගේ ඇස් යන්නේ නිතැතිනි. ඒ සේයාරුවේ ඉන්නා පුද්ගලයා හඳුනාගන්නට ඇයට මහන්සියක් ගන්නට අවශ්‍ය නොවෙයි. අකලංක.. ඒ අකලංක මය. පත්තරයේ හෙඩිමට ඇගේ ඇහැ යන්නේ ඉන් පසුව ය.

"කෝටිපති පුතා යළිත් මැරබලය පෙන්-වයි.. පහර කෑ ආරක්ෂක නිලධාරියාට අසාධ්‍යයි"

මතු සම්බන්ධයි